අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය 'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு 'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
Ministry of Education, Higher Education and Vocational Education 'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/4/58/16/01/13(I)
ඔබේ යොමුව / உமது இல. / Your Ref.
දිනය / திகதி / Date 2025.08.20

නම ............................................... ආසන අංකය ..................

ජා.හැ.අංකය ...............................................

ගරු ස්වාමීන්වහන්ස/මහත්මයාණෙනි/ මහත්මියනි/ මෙනෙවියනි,

**ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III ශ්‍රේණියට සීමිත පදනම මත බඳවා ගැනීම - 2021(2023) පත්වීම් ලිපි ප්‍රදානය කිරීම**

අංක 1925/37 හා 2015.07.28 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කර ඇති ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා ව්‍යවස්ථානුකූලව සහ අංක 2231 හා 2021.06.04 දිනැති ගැසට් පත්‍රයේ පළ කර ඇති බඳවා ගැනීමේ ගැසට් නිවේදනය අනුව, ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III ශ්‍රේණියට නිලධාරීන් බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය 2020/2021 මඟින් පුරප්පාඩු 442ක් පිරවීම සඳහා පැවැති ලිඛිත විභාගයේ හා වාචික පරීක්ෂණයේ මුළු ලකුණුවල එකතුවෙහි ප්‍රමුඛතාව මත සහ ඔබ විසින් සඳහන් කර ඇති මනාප අනුපිළිවෙල අනුව, ඉහළම ලකුණු ලැබූ අයදුම්කරුවන් අතුරින් ඔබ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III ශ්‍රේණියට පත්වීම් ලැබීමට සුදුසුකම් ලබා ඇති බව සතුටින් දැනුම් දෙමි.

02. ඒ අනුව, මෙම පත්වීම් ලිපි ප්‍රදානය කිරීමේ උත්සවය 2025.09.01 වන සඳුදා දින පෙ.ව.10.00 ට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය හරිනි අමරසූරිය මැතිනියගේ ප්‍රධානත්වයෙන් අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ දී පැවැත්වීමට නියමිතය. එබැවින් එම උත්සවයට සහභාගී වීම සඳහා ඔබ එදින **පෙ.ව. 8.00 වන විට ජාතික හැඳුනුම්පත හෝ අනන්‍යතාවය සහතික කළ හැකි ලේඛනයක්** රැගෙන අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ 04 වන මහලේ පිහිටි ශ්‍රවණාගාරය වෙත පැමිණිය යුතු වේ.

03. එමෙන්ම, රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020 හි සඳහන් විධිවිධාන අනුව ඔබගේ පත්වීමට අදාළව සුදුසුකම් පරීක්ෂා කිරීමේ දිනය වන 2021.07.30 දින සිට මේ දක්වා විනයානුකූලව දඬුවමක් ලබා තිබේද/ චෝදනා පත්‍රයක් නිකුත් කර තිබේද යන්න තහවුරු වන **ලේඛනයක් ඇමුණුම 01 පරිදි කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙතින් සම්පූර්ණ කරවා ගෙන පත්වීම් ලිපි ප්‍රදානය සිදු කරන දින රැගෙන ඒම අනිවාර්ය වේ.** මෙම ආකෘති පත්‍රය සම්පූර්ණ කර ඉදිරිපත් නොකරන නිලධාරීන් වෙත එදින පත්වීම් ලිපි ප්‍රදානය කිරීම සිදු නොකරන බව ද කාරුණිකව දන්වා සිටිමි.

04. මෙම පත්වීම් ලිපි ප්‍රදානෝත්සවය සඳහා සහභාගීවීමේ දී පහත කරුණු කෙරෙහි අවධානය යොමු කරන ලෙස වැඩිදුරටත් දන්වා සිටිමි.

I. පත්වීම්ලාභීන් ජාතික ඇඳුමින් හෝ යුරෝපීය ඇඳුමින් සැරසී පැමිණිය යුතු අතර, පත්වීම්ලාභිනියන් ලා පැහැති සාරියකින් හෝ ඔසරියකින් සැරසී පැමිණිය යුතුය.

ගරු අමාත්‍යතුමිය / கௌரவ அமைச்சர் / Hon. Minister +94112784832 +94112784825 minister.education@moe.gov.lk
ලේකම් / செயலாளர் / Secretary +94112784811 +94112785162 secretary.education@moe.gov.lk moesecretaryoffice@gmail.com

II. ඔබට ලබා දී ඇති ආසන අංකය අනුව නියමිත ස්ථානයේ අසුන්ගත යුතුය.

III. මෙම පත්වීම් ලිපි ප්‍රදානෝත්සවය සඳහා පත්වීම්ලාභීන් පමණක් සහභාගී විය යුතු අතර, වෙනත් කිසිදු බාහිර පුද්ගලයෙකු පත්වීම් ප්‍රදානෝත්සවය පැවැත්වෙන ශාලාව වෙත කැඳවාගෙන යාමට අවසර දෙනු නොලැබේ.

IV. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා ව්‍යවස්ථාවේ 12.2.(ii) අනුව, ඔබ විසින් සම්පූර්ණ කළ යුතු සේවාරම්භක පුහුණුව පත්වීම් ලබා දෙන දිනයේ සිටම ආරම්භ වන බැවින් ඔබ ඒ සඳහා ඇමුණුම 02 හි සඳහන් පරිදි සූදානම්ව පැමිණිය යුතු වේ.

V. තවද, මෙම පත්වීම් ලිපි ප්‍රදානෝත්සවය සඳහා සහභාගීවීමේ දී පහත ලේඛන ද රැගෙන පැමිණීම අනිවාර්ය වේ.

- ඔබගේ ජාතික හැඳුනුම්පත සමඟ එහි සහතික කළ පිටපතක්
- අවසන්වරට ගෙවන ලද වැටුප් පත්‍රිකාවේ සහතික කළ පිටපතක්
- ඔබගේ වැටුප බැරවිය යුතු ගිණුම් අංකය ඇතුලත් බැංකු පාස් පොතේ/ මාසික ගිණුම් වාර්තාවේ පිටපතක්
- 2025 සැප්තැම්බර් මස සිට ඔබගේ වැටුප බැරවිය යුතු ගිණුමට අදාළ බැංකු පොතෙහි ගිණුම් අංකය, ගිණුම අයත් ශාඛාව, ඔබගේ නම හා ජාතික හැඳුනුම්පත් අංකය ඇතුලත් කරමින් සකස් කරන ලද ඔබගේ බැංකු ගිණුමේ විස්තර පිළිබඳ දැනුම්දීම සඳහා මෙම අමාත්‍යාංශයේ ප්‍රධාන මූල්‍ය නිලධාරී වෙතින් කරනු ලබන ඉල්ලීමේ ලිපිය. (ඇමුණුම 03 ආකෘතිය අනුව සකස් කළ යුතුය.)

05. ඉහත 04. IV ඡේදය අනුව, සේවාරම්භක පුහුණුව පත්වීම් ලබන දින සිටම ආරම්භ වන බැවින් මෙම ලිපියේ පිටපතක් ඔබගේ ආයතන ප්‍රධානියා මඟින් පත්වීම් බලධාරියා වෙත යොමු කරමින්, ඔබ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ රාජකාරි 2025.09.01 දින සිට භාර ගැනීමට හැකි වන පරිදි 2025.08.31 දින සිට වර්තමාන සේවා ස්ථානයෙන් බැහැර වන බවට අදාළ ආයතන ප්‍රධානීන් දැනුවත් කර පැමිණෙන ලෙස ද වැඩිදුරටත් දන්වා සිටිමි.

06. මේ සඳහා ගමන් වියදම් හෝ වෙනත් දීමනා කිසිවක් ගෙවනු නොලැබේ.

කේ.කේ.පී. ආරියසිංහ
අතිරේක ලේකම් (අධ්‍යාපන සේවා ආයතන)

අත්.කලේ: නාලක කලුවැව
ලේකම්

අවධානයට: 2025.09.01 දින පත්වීම් ලිපි ප්‍රදානෝත්සවයට සහභාගී වීම සඳහා කැඳවීමේ ලිපිය නොලද නිලධාරීන් මෙම ලිපිය අමාත්‍යාංශ වෙබ් අඩවියේ (www.moe.gov.lk) "විශේෂ දැන්වීම්" තීරය වෙතින් බාගත කර පිටපතක් රැගෙන ඒම ප්‍රමාණවත් වේ.